සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර පරීක්ෂණය - 2019

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: 1 | පැය / மணித்தியாலம் / Hours: 01 |

-සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතුයි
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වලදී (1) , (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හා ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

1. දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය වන්නේ
(1) පුරාණ ගිවිසුමය (2) ශුද්ධ බයිබලය (3) ප්‍රඥා සාහිත්‍යය (4) පංච පුස්තකය

2. පුරාණ ගිවිසුමේ දිවැසිවර ග්‍රන්ථයකි
(1) දානියෙල් (2) ප්‍රේම ගී (3) විලාප ගී (4) සිරාක්

3. බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ සමාජීය හා ආගමික ප්‍රතිස්ථාපනය ගැන කරුණු මූලිකව සඳහන් වන්නේ
A - එස්රා පොත B - එස්තර් පොත C - තෝබිත් පොත D නෙහෙමියා පොත
ඉහත පිළිතුරු වලින් නිවැරදි පිළිතුර වන්නේ
(1) A හා Bය. (2) B හා Dය. (3) A හා Cය (4) A හා Dය

4. "ස්වාමින් වහන්සේගේ වචනය සදහට ම පවතියි. මේ වචනය නම් ඔබට " දේශනා කරන ලද සුබ අස්නය" මෙසේ ප්‍රකාශ කරන ලද්දේ
(1) ශුද්ධ වූ පේදුරු තුමා ය. (2) ශුද්ධ වූ ජොහන් තුමා ය. (3) ශුද්ධ වූ පාවුලු තුමා ය. (4) ශුද්ධ වූ මතෙව් තුමා ය.

5. ශුද්ධ වූ බයිබලයේ ඇති ඉතිහාස පොත් ගණන වන්නේ
(1) 5 කි. (2) 16 කි. (3) 7 කි. (4) 21 කි

6. පහත කරුණු ගැන අවධානය යොමු කරන්න.
- ඔහු චිත්‍ර ශිල්පියෙකි.
- ඔහු අපොස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ කතුවරයා ය.
- එතුමා ශුද්ධ වූ පාවුලු තුමාගේ දෙවන ධර්මදූත චාරිකාවට සම්බන්ධ වී ඇත.

ඉහත කරුණු වලින් කියවෙන පුද්ගලයා වන්නේ
(1) ශුද්ධ වූ ජුවාම් තුමා ය. (2) ශුද්ධ වූ පේදුරු තුමා ය. (3) ශුද්ධ වූ ලූක් තුමා ය. (4) ශුද්ධ වූ ජොහාන් මාක් තුමා ය.

7. අපොස්තුලුවරුන්ගේ ක්‍රියා පොත රචනා වී ඇති කාල වකවානුව වන්නේ
(1) ක්‍රි. ව. 90-100 අතර (2) ක්‍රි.ව. 85-95 අතර (3) ක්‍රි.ව. 70-100 අතර (4) ක්‍රි.ව. 80-90 අතර

8. පාවුලු තුමා විසින් ම ලියූ සංදේශ ගණන වන්නේ
(1) හතකි (2) අටකි (3) විසි එකකි (4) දහ තුනකි

9. වෙනත් සංදේශ වලින් සංදේශ තුනක් ලියූ කිතු සමිඳුන්ගේ අපෝස්තුලුවරයා වන්නේ
(1) ශුද්ධ වූ ජොහන් තුමා ය. (2) ශුද්ධ වූ පාවුලු තුමා ය. (3) ශුද්ධ වූ ජාකොබ් තුමා ය. (4) ශුද්ධ වූ පේදුරු තුමා ය.

10. "තියෝපිලස්" යන නාමයේ අර්ථය වන්නේ
(1) "දෙවියන් වහන්සේගේ දූතයා" (2) ක්‍රිස්තුන් වහන්සේගේ මිත්‍රයා "
(3) "ක්‍රිස්තුන් වහන්සේගේ සේවකයා " (4) "දෙවියන් වහන්සේගේ මිත්‍රයා"

11. ශුද්ධ වූ පාවුලු තුමා සිරගතව සිටින විට ලියූ ලිපි වන්නේ
A - කොලොස්සි ලිපිය B - ගලාති ලිපිය C - පිලිප්පි ලිපිය D - එපීස ලිපිය
මින් වඩාත් නිවැරදි වන්නේ
(1) A හා B ය. (2) C හා D ය. (3) A හා C ය . (4) B හා C.

12. ශුද්ධ වූ පාවුලු තුමා විසින් ම ලියන ලද සංදේශ වන්නේ
A - ගලාති ලිපිය B - රෝම ලිපිය C - එපීස ලිපිය D - පිලිප්පි ලිපිය
ඉහත පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ
(1) A ,B හා C ය. (2) A , B හා D ය. (3) B , C හා D ය. (4) A , C හා D ය.

13. ශුද්ධ වූ පාවුලු තුමාගේ සංදේශ බොහෝ විට ගනු ලබන්නේ
(1) පාස්කු කාලයේ දිව්‍ය පූජාවේ දී (2) වතාරික කාලයේ දිව්‍ය පූජාවේ දී
(3) නත්තල් කාලයේ දිව්‍ය පූජාවේ දී (4) ඉරු දින දිව්‍ය පූජාවේ දෙවන කියවීමේ දී

14. ශුද්ධ වූ පාවුලු තුමා ලිපි ලියා ඇත්තේ
(1) විවිධ සංඝ වලට හා පුද්ගලයින්ට (2) ජනනායකයින්ට හා දිවැසිවරුන්ට
(3) ජුදා ජාතිකයින්ට හා අන්‍ය ජාතිකයින්ට (4) අයකැමියන්ට හා පරිසිවරුන්ට

15. නව ගිවිසුමේ වෙනත් හසුන් සඳහා භාවිතා කර ඇති නමකි
(1) ද්විතීය සංදේශ (2) විශ්ව සංදේශ (3)ආරූඪ සංදේශ (4) දිවැසි සංදේශ

16. එළිදරව් සාහිත්‍යයේ වර්ණ සංකේතයකි.
(1) සුදු (2) කහ (3) නිල් (4) දම්

17. එළිදරව් සාහිත්‍යයේ මකරා හා මෘගයා මගින් සංකේතවත් කරන්නේ,
(1) යක්ෂයා හා බැටළුවා (2) යක්ෂයා හා පීඩාකාරී බලවේග (3) මරණය හා සාගතය (4) සාතන් හා නපුර

18. එළිදරව් පොත ලියවුනේ කුමන අධිරාජ්‍යයා කාලයේ ද?
(1) නීරෝ අධිරාජ්‍යයාගේ කාලයේ (2) සෙප්ටිමස් අධිරාජ්‍යයාගේ කාලයේ
(3) ඩොමීෂියන් අධිරාජ්‍යයාගේ කාලයේ (4) හෙරෝද් අධිරාජ්‍යයාගේ කාලයේ

19. එළිදරව් සාහිත්‍ය යේ 7 සහ 12 සංඛ්‍යා සංකේත වලින් අදහස් වන්නේ
(1) පරිපූර්ණත්වය හා දේව ජනතාව (2) ඉශ්‍රායෙලය හා විශ්වය
(3) විශ්වය හා පූර්ණත්වය (4) පූර්ණත්වයහා ඉශ්‍රායෙලය

20. වර්තමානයේ අපගේ දුක් විඳීම ඉවසා දරා ගැනීමට ආරාධනා කරන එළිදරව් සාහිත්‍යයේ ලකෂණයකි
(1) ද්විත්ව වාදය (2) සමාජ වාදය (3) යුගාන්තවාදය (4) සංකේත භාවිතය

21. "මම නුඹේ ඉල්ලීම එලෙස ඉටු කරමි. නුඹට සමාන කෙනෙකු නුඹට පළමුව සිටියේවත් නුඹට පසුව සිටින්නේවත් නැතිවන ලෙස තියුණු නැණ නුවන නුඹට දෙමි. " මෙය කාවිසින් කියන ලද්දක් ද?
(1) දෙවියන් වහන්සේ විසින් සලමොන් රජ තුමාට (2) දෙවියන් වහන්සේ විසින් දාවිත් රජතුමාට
(3) දෙවියන් වහන්සේ විසින් යෙසායා දිවැසිවරයාට (4) දෙවියන් වහන්සේ විසින්මෝසෙස් තුමාට

22. “හොක්මා“ යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය වන්නේ

(1) එදිනෙදා ජීවිතයේ ප්‍රඥාවන්තව ජීවත් වීමේ හැකියාවයි (2) සාර්ථකව හා ධර්මිෂ්ඨව ජීවත් වීමේ හැකියාවයි

(3) පවුල තුළ ප්‍රඥාව ඇතිව ජීවත් වීමේ හැකියාවයි (4) එදිනෙදා ජීවිතයේ ප්‍රශ්න වලට මුහුණ දීමේ හැකියාවයි

23. A - ගීතාවලිය B - නෙහෙමියා C - විලාවලිය D - ධර්මදේශකයා

ඉහත ග්‍රන්ථ අතරින් ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ ඇතුළත් පිළිතුර වන්නේ

(1) A හා B ය (2) C හා D ය (3) B හා D ය (4) A හා D ය

24. රාජ්‍ය පාලනය හා අනිකුත් පරිපාලන ක්ෂේත්‍රයන් ඉලක්ක කරගෙන යෞවනයන් පුහුණු කිරීම සඳහා පුරාණ ගිවිසුමේ ලියා ඇති ග්‍රන්ථය වන්නේ

(1) හිතෝපදේශය (2) ගීතාවලිය (3) සලමොන්ගේ ප්‍රඥාව (4) සිරාක් හෙවත් උපදේශකයා

25. ප්‍රඥාවන්තව කටයුතු කිරීම යනු

(1) ශුද්ධ වූ සභාවේ පනත් අනුව ජීවත් වීමයි (2) එදිනෙදා ජීවිතය තුළ යහපත පමණක් තෝරාගෙන ජීවත් වීමයි

(3) හැම විටම දෙවියන්ට යාච්ඤා කර ජීවත් වීමයි (4) නිතරම සත්‍ය ප්‍රකාශ කර ජීවත් වීමයි

26. ජේසුස් වහන්සේගේ කරපිට තැබූ කුරුසිය උසුලාගෙන යාමට සහය වන්නේ

(1) සිරේනියේ සීමොන් ය (2) අරිමතියේ ජෝසෙප් ය (3) පේදුරු තුමා ය (4) ජුවාම් තුමා ය

27. ජේසුස් වහන්සේගේ උත්ථානයේ ප්‍රථම සාක්ෂිකාරිය වූයේ

(1) මාර්තා ය (2) එළිසබෙත් තුමිය ය (3) මග්දලා හී මරියා ය (4) මරිය තුමිය ය

28. “මාගේ ස්වාමිනී , මාගේ දෙවියනී “ පවසමින් තම විශ්වාසය ප්‍රබල ලෙස ප්‍රකාශ කළේ

(1) ශු. පේදුරු තුමා ය (2) ශුද්ධ වූ තෝමස් තුමා ය (3) ශුද්ධ වූ පාවුලු තුමා ය (4) ශුද්ධ වූ ජාකොබ් තුමා ය

29. එම්මාවුස් බලා ගිය ශ්‍රාවකයන් දෙදෙනා ක්‍රිස්තුන් වහන්සේව හඳුනා ගත්තේ

(1) උන්වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය අවස්ථාවේ (2) උන්වහන්සේ යාච්ඤා කළ අවස්ථාවේ

(3) උන්වහන්සේ සමග කතා කරමින් යන අවස්ථාවේ (4) රොටී ආශිර්වාදකර කඩා දුන් අවස්ථාවේ

30.ජේසුස් වහන්සේ පව් කමා කිරීමේ බලය අපෝස්තුලුවරුන්ට දානය කළේ

(1) පාස්කු ඉරුදින හවස ය (2) උන්වහන්සේ උත්ථාන වූ අවස්ථාවේ ය

(3) පෙන්තකොස්ත මංගල්‍යය දිනදී ය (4) අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේ ය

31. මුල් කිතුනු සභාවේ සහනාධාර එකතු කිරීම සඳහා පත් කළේ

(1) අපෝස්තුලුවරුන් ය (2) ගෝලයන් ය (3) උපස්ථායකයන් ය (4) පරිසිවරුන් ය

32. සන්තියාගෝ මුනිතුමාව හිස ගසා මරා දමන ලද්දේ

(1) ස්තේපන් තුමා ය (2) පිලාත් ආණ්ඩුකාරයා ය (3) නායක පූජකයන්ය (4) හෙරෝද් (අග්‍රිපා 1) ය

33. ශුද්ධ වූ සභාවේ උපන් දිනය ලෙස සැලකෙන්නේ

(1) පාස්කු මංගල්‍යය දිනය (2) පෙන්තකොස්ත මංගල්‍යය දිනය

(3) නත්තල් මංගල්‍යය දිනය (4) මහා සිකුරාදා දිනය

34.පෙන්තකොස්ත මංගල්‍යයට සහභාගී වීම සඳහා ජුදෙව්වරු වන්දනා ගමන් ගියේ

(1) ජෙරුසලම් දේව මාළිගයට (2) පොරොන්දු දේශයට (3) සීනායි කඳු මුදුනට (4) මිසරයට

35. පහත කරුණු ගැන අවධානය යොමු කරන්න
- පෙන්තකොස්ත දින අන්‍ය භාෂා වලින් කතා කිරීම
- දේශනයෙන් පසු 3000 ක් බෞතීස්මය ලැබීම
- ඉතාලි භට හමුදාවේ ශතාධිපතියෙකු වූ කොරෙන්ලියස් හට සුබ අස්න දේශනා කිරීම

ඉහත කරුණු වලින් කියවෙන පුද්ගලයා වන්නේ,

(1) ශුද්ධ වූ ජුවාම් තුමා ය (2) ශුද්ධ වූ පාවුලු තුමා ය (3) ශුද්ධ වූ පේදුරු තුමා ය (4) ශුද්ධ වූ ස්තේපන් තුමා ය

36. ශුද්ධ වූ පාවුලු තුමා උපත ලැබුවේ

(1) ගලීලයේ හි (2) තාර්සස් හි (3) රෝමයෙ හි (4) අන්තියෝකයෙ හි

37. සාවුල් ට ප්‍රසාද ස්නාපනය දෙන ලද්දේ

(1) අනනියස් තුමා ය (2) ලූක් තුමා ය (3) ස්තේපන් තුමා ය (4) තිමෝතියස් තුමා ය

38. ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය පිළිබඳ ගැටලු වලට පිළිතුරු දීමට පාවුලු තුමා සිදු කළේ කුමක්ද?

(1) පළමු ධර්මදූත චාරිකාව යාම (2) ලූක් තුමා මගින් දේශනා කිරීම
(3) කිතුනු සභා ස්ථාපිත කිරීම (4) සංදේශ ලියා යැවීම

39. ශුද්ධ වූ පාවුලු තුමා තම ධර්මදූත ගමන් තුනම ආරම්භ කළේ

(1) පෙරුසලමෙ නි (2) දර්බයෙ නි (3) සිරියාවේ අන්තියෝකයෙ නි (4) එපීසියෙ නි

40.“අන්‍ය ජාතීන්ගේ අපෝස්තුලුවරයා “ යන ගෞරව නාමය ලැබුයේ

(1) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා ය. (2) ශුද්ධ වූ ජොහන් මාක් තුමා ය.
(3) ශුද්ධ වූ ලූක් තුමා ය. (4) ශුද්ධ වූ පාවුලු තුමා ය.

(ලකුණු 1×40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර පරීක්ෂණය - 2019

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | 2 | පැය / மணித்தியாலம் / Hours | 02 |
|---|---|---|---|---|---|---|---|

- ➢ පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ➢ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද , තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

(1) 1/ ශුද්ධ වූ බයිබලයේ ප්‍රධාන කර්තෘ හා උප කර්තෘ නම් කරන්න

2/ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ අපෝස්තුලුවරු සුබ අස්න දේශන කිරීමට පටන් ගත් නගර දෙක නම් කරන්න

3/ ශුද්ධ වූ පාවුලු තුමාගේ ලිපි ලිවීමේ පරමාර්ථ දෙක ලියන්න

4/ ශුද්ධ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති කෘති දෙක නම් කරන්න

5/ අභිධාර්මික ප්‍රඥාව ඇතුළත් කෘති දෙකක් නම් කරන්න

6/ "මම අල්ෆා සහ ඔමෙගාය" මෙහි අර්ථය ලියා දක්වන්න

7/ ශුද්ධාත්මයාණන්ගේ ආගමනයෙන් පසු ශ්‍රාවකයන් තුළ ඇති වූ වෙනස්කම් දෙකක් ලියන්න

8/ උපස්ථායකයන් තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න

9/ ශුද්ධ වූ පාවුලු තුමාට ධර්මදූත චාරිකාවලදී මුහුණ දීමට සිදු වූ අභියෝග 2 ක් ලියන්න

10/ ශුද්ධ වූ පාවුලු තුමා දෙවන ධර්ම දූත චාරිකාවට සහභාගි කරවා ගත් දෙදෙනෙකුගේ නම් ලියන්න

(ලකුණු 2×10=20)

(2) 1/ මුල් කිතුනු සභාවේ ලක්ෂණ හතර ලියන්න

2/ වැඩිහිටි කිතුනුවෙකු ලෙස අභිෂේක ආලේපයෙන් ශුද්ධාත්ම බලය ලැබූ ඔබ පාසල තුළ ආදර්ශමත් ලෙස කටයුතු කරන ආකාර 2 ක් ලියන්න

3/ මුල් කිතුනු සභාවේ ලක්ෂණ ඔබ මීසම තුළ ක්‍රියාත්මක කිරීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග 5 ක් ලියා විස්තර කරන්න (ලකුණු 2+3+5=10)

(3) 1/ ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න

2/ පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණය අනුව 2 වංශාවලිය , විලාප ගී ,දානියෙල් පොත් අයත් පොත් කාණ්ඩ වෙන වෙනම ලියා දක්වන්න

3/ ශුද්ධ වූ බයිබලය ඔබේ ජීවිතයට වැදගත් වන ආකාරය කරුණු පහකින් ලියා දක්වන්න

(ලකුණු 2+3+5=10)

(4) 1/ පාස්කු අභිරහස යනු කුමක්ද?

2/ ජේසුස් වහන්සේව පිලාත් ආණ්ඩුකාරයා වෙත රැගෙන ගොස් ඔවුහු උන්වහන්සේට නැගූ චෝදනා තුන ලියන්න

3/ ජේසුස් වහන්සේ කුරුසයේ ඇණ ගැසූ පසු ඔවුන් වහන්සේ "පියාණනී ඔවුන්ට කමා වුව මැනව . ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති"යි වදාළ සේක. මෙම වගන්තියෙන් ඔබේ ජීවිතට ගත හැකි ආදර්ශ 5 ක් ලියා විස්තර කරන්න

(ලකුණු 2+3+5=10)

(5) 1/ එළිදරව් සාහිත්‍යයේ සංකේත භාවිතයේ පරමාර්ථ දෙකක් ලියන්න

2/ දානියෙල් ග්‍රන්ථය ලියවුණු කාලය, ලිවීමට හේතු හා එහි කර්තෘත්වය ආරූඪ කර ඇත්තේ කාටද යන්න ලියා දක්වන්න

3/ එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ ඔබේ ජීවිතයට වැදගත් වන ආකාරය කරුණු 5 කින් ලියා විස්තර කරන්න

(ලකුණු 2+3+5=10)

(6) 1/ ශුද්ධ වූ පාවුලු තුමා පළමු ධර්මදූත චාරිකාවේදී සෑම නගරයකටම ගොස් සිදු කළේ කුමක්ද?

2/ ශුද්ධ වූ පාවුලු තුමාගේ හසුන් වර්ගීකරණයේ කොටස් තුන ලියා දක්වන්න

3/ ශුද්ධ වූ පාවුලු තුමාගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 5ක් ලියා විස්තර කරන්න

(ලකුණු 2+3+5=10)

(7) පහත සදහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න ( පේළි 12ක් පමණ )

1/ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත

2/ පෙන්තකොස්ත සිද්ධිය

3/ ප්‍රඥා සාහිත්‍ය යේ අරමුණු හා එහි ආධ්‍යාත්මිකත්වය

4/ නව අහස හා නව පොළොව

(ලකුණු 5+5=10)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර පරීක්ෂණය - 2019

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | 1 | පැය / மணித்தியாலம் / Hours | 01 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:-

-සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතුයි

- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වලදී (1) , (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හා ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරන්න.

- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

1. දේව අනාවරණයේ ප්‍රධාන මූලාශ්‍ර දෙක වන්නේ
   (1) පුරාණ ගිවිසුම/නව ගිවිසුම (2) ඉතිහාස පොත්/නීති පොත්
   (3) ශුද්ධ වූ බයිබලය / ජීවන සහා සම්ප්‍රදාය (4) දිවැසි ග්‍රන්ථ / එළිදරව් සාහිත්‍යය

2. පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණය අනුව ධර්මදේශකයා පොත අයත් පොත් කාණ්ඩය වන්නේ
   (1) ඉතිහාස පොත් (2) එළිදරව් සාහිත්‍යය (3) නීති පොත් (4) ප්‍රඥා සාහිත්‍යය

3. ඉශ්‍රායෙල් ජනතාවගේ කාන්තාර ගමන ගැන විස්තර කරන පුරාණ ගිවිසුමේ පොත කුමක්ද?
   (1) උත්පත්ති පොත (2) ගණන් කතාව (3) නික්මයාම (4) ලෙවී ව්‍යවස්ථාව

4. පූජක සම්ප්‍රදායට අයත් සිද්ධි ලෙස ගැනෙන්නේ
   A - ඊසාක් පූජා කිරීම B - මැවීම පිළිබඳ පළමු කතාව C - කායින් හා ආබෙල් D- නෝවා සමග ගිවිසුම
   ඉහත පිළිතුරු වලින් නිවැරදි පිළිතුර වන්නේ
   (1) B හා D ය. (2) C හා D ය. (3) A හා B ය. (4) B හා C ය.

5. දෙවියන් වහන්සේ සමග කළ ගිවිසුමට විශ්වාසවන්තව ජීවත් වෙමින් එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බවට උපදෙස් දෙන සම්ප්‍රදාය කුමක්ද?
   (1) යාවේ සම්ප්‍රදාය (J ) (2) ද්විතීය නීති සම්ප්‍රදාය (D) (3) එලොහිම් සම්ප්‍රදාය (E) (4) පූජක සම්ප්‍රදාය (P)

6. දෙවියන් වහන්සේගේ මිතුරෙකු වීමට ඔබට කළ හැකි කාර්යයක් වන්නේ
   (1) විනෝද චාරිකා වලට සහභාගි වීම
   (2) ජේසුස් වහන්සේගේ ශුභාරංචිය අන් අය වෙත ගෙන යාමට උත්සහ කිරීම
   (3) මිතුරන්ගේ උපන්දින සාදයන්ට සහභාගී වීම
   (4) උපකාරක පන්ති වලට සහභාගි වීම

7. ග්‍රීසියේ "අක්කායා" නම් ස්ථානයේ ක්‍රි.ව. 80-90 අතර කාලය තුළ රචනා වී ඇති ග්‍රන්ථය කුමක්ද?
   (1) ශුද්ධ වූ ලූක් ශුභාරංචිය (2) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත
   (3) ශුද්ධ වූ ජොහන් ශුභාංරචිය (4) එළිදරව් පොත

8. ශුද්ධ වූ බයිබලයේ ග්‍රීක බසින් ලියන ලද පිටපත හඳුන්වනු ලබන්නේ
   (1) ඇරමයික් (2) හෙබ්‍රෙව් (3) මැසොරෙටික් (4) සෙප්ටුවාජින්ත

9. ජුදෙව්වරුන් හා කතෝලික නොවන ක්‍රිස්තු භක්තිකයන් පුරාණ ගිවිසුමේ සම්මත ග්‍රන්ථ ලෙස පිළිගනු ලබන්නේ
   (1) පොත් 39 කි (2) පොත් 46 කි (3) පොත් 27 කි (4) පොත් 66 කි

**10.** පුරාණ ගිවිසුමට අයත් ද්විතීය සම්මත ග්‍රන්ථ වන්නේ

**(1)** තෝබිත් / බාරුක් /ගීතාවලිය **(2)** ජුදිත් / වීරාවලිය / ජෝබ්

**(3)** බාරුක් / ජුදිත් / උපදේශකයා **(4)** 1 මකබිවරු / නෙහෙමියා / එස්රා

**11.** ශුද්ධ වූ පාවුලු තුමා සිරගතව සිටින විට ක්‍රිස්තු භක්තිකයින්ගේ විශ්වාසයේ ස්ථිර ව සිටින ලෙස දන්වා යැවූ ලිපිය වන්නේ

**(1)** කොලොස්සි ලිපිය **(2)** 1 කොරෙන්ති ලිපිය **(3)** රෝම ලිපිය **(4)** පිලිප්පි ලිපිය

**12.** නව ගිවිසුමේ කතෝලික සංදේශ සංඛ්‍යාව වන්නේ

**(1)** අටකි **(2)** දහතුනකි **(3)** හතරකි **(4)** පහකි

**13.** දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ වන්නේ

A - ධ්‍යානයට සම වැදීම B - දේව වචනය ප්‍රකාශ කිරීම

C - අනාගතය ගැන කීම D - කණ්ඩායම් වශයෙන් මෙහෙවරෙහි යෙදීම

ඉහත පිළිතුරු වලින් නිවැරදි පිළිතුර වන්නේ

**(1)** Aහා D ය. **(2)** A , B හා C ය. **(3)** B , C හා D ය. **(4)** B හා C ය.

**14.** දිවැසිවරුන් ග්‍රීක භාෂාවෙන් "ප්‍රොෆෙටේස් " යන නමින් හැදින්වූ අතර එහි අර්ථය වූයේ

**(1)** " කෙනෙකු වෙනුවෙන් පෙනී සිටින්නා " යන්නයි **(2)** " කෙනෙකු වෙනුවෙන් කතා කරන්නා" යන්නයි

**(3)** "කෙනෙකු වෙනුවෙන් මැදිහත් වන්නා යන්නයි **(4)** " කෙනෙකු වෙනුවෙන් දිවි පුදන්නා" යන්නයි

**15.** බැබිලෝනියානු විප්‍රවාසගත ජනතාව තුළ නව බලාපොරොත්තු ඇති කළ දිවැසිවරයා වන්නේ

**(1)** යෙසායා දිවැසිවරයා ය **(2)** ජෙරමියා දිවැසිවරයා ය **(3)**එසකියෙල් දිවැසිවරයා ය **(4)**නාතාන් දිවැසිවරයා ය.

**16.** එළිදරව් සාහිත්‍යයේ එන සුදු හා රතු වර්ණ සංකේත වලින් අදහස් කරන්නේ

**(1)** සාගතය හා මරණය **(2)** ජයග්‍රහණය හා පරිපූර්ණත්වය

**(3)** විශ්වය හා පූර්ණත්වය **(4)** ජයග්‍රහණය හා යුද්ධය , ලේ වැගිරීම

**17.** නව ගිවිසුමේ සංකේත භාවිතයෙන් ලියා ඇති ග්‍රන්ථය කුමක් ද?

**(1)** ගණන් කතාව **(2)** හිතෝපදේශය **(3)** ධර්මදේශකයා **(4)** දානියෙල් පොත

**18.** පහත සිදුවීම් කෙරෙහි අවධානය යොමු කරන්න

A - ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බව

B - ජේසුස් වහන්සේ සමාජයේ අසරණ වූවන් වෙනුවෙන් කටයුතු කළ බව

C - නව ගිවිසුමේ නීති දායකයාණන් ක්‍රිස්තුන් වහන්සේ බව

D – උන්වහන්සේ අදහා ගැනීමෙන් සදාතන ජීවිතය ලැබෙන බව

ඉහත සඳහන් කරුණු අතරින් ජොහන් ශුභාරංචියට අදාළ කරුණු දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) A ,B හා C ය **(2)** C , D හා E ය **(3)** A හා D ය. **(4)** B , D හා E ය

**19.** ජේසුස් වහන්සේගේ වංශාවලියෙන් ශුභාරංචිය ආරම්භ කරන ශුභාරංචි කතුවරයා කවුද?

**(1)** ශුද්ධ වූ මාක් තුමා ය **(2)** ශුද්ධ වූ මතෙව් තුමා ය **(3)** ශුද්ධ වූ ලූක් තුමා ය **(4)** ශුද්ධ වූ ජුවාම් තුමා ය

**20.**ශුද්ධ වූ මාක් තුමාගේ ශුභාරංචිය ලියවුණු කාලය හා ස්ථානය වන්නේ

**(1)** ක්‍රි.ව. 64-66 /රෝමයේ **(2)** ක්‍රි.ව. 80-85/සිරියාවේ අන්තියෝකයේ

**(3)** ක්‍රි.ව. 80-90 / සිරියා පලස්තීනයේ **(4)** ක්‍රි.ව. 90-100 /එපීසියේ

**21.**මැවීමේ කතා පුවත් දෙක අන්තර්ගත වන්නේ

**(1)** නික්මයාම පොතේ ය. **(2)** උත්පත්ති පොතේ ය **(3)** ලෙවී ව්‍යවස්ථාවේ ය **(4)** ගණන් කතාවේ ය

22. පළමු මැවීමේ කතාව තුළ හත්වන දින " දෙවියන් වහන්සේ නිවාඩු ගත් සේක. " යනුවෙන් බයිබලීය කතුවරයා අදහස් කරන්නේ කුමක්ද? මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ
(1) සබත් දින විවේකව සිටිය යුතු බව ඉස්මතු කිරීමයි
(2) ඉරුදින දහම් පාසලට යා යුතු බව ඉස්මතු කිරීමයි
(3) දෙවියන් වහන්සේ සබත් දින නිවාඩු ගත් බව ඉස්මතු කිරීමයි
(4) සබත් දිනයේ වැදගත් බව ඉස්මතු කිරීමයි

23. "මාගේ දෙවි සමිඳුනී , ඔබ මාගේ පියා වූ දාවිත් වෙනුවට ඔබේ දාසයා රජ කොට පත් කළ සේක. " මෙය කා විසින් කා හට කියන ලද්දක් ද?
(1) සාවුල් රජතුමා විසින් දෙවියන් වහන්සේට (2) සලමොන් රජතුමා විසින් දෙවියන් වහන්සේට
(3) පාරාවෝ රජතුමා විසින් දෙවියන් වහන්සේට (4) පෙරබුවාම් රජතුමා විසින් මෝසෙස් තුමාට

24. පුරාණ ගිවිසුම තුළ ප්‍රඥාව සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ
(1) ලිටුර්ජියා (2) ලාඕස් (3) හොක්මා (4) ටෝරා

25. එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන අවස්ථා සඳහා උපදේශන ඇතුලත් ප්‍රඥා සාහිත්‍යට සම්බන්ධ ග්‍රන්ථය කුමක්ද?
(1) හිතෝපදේශය (2) සලමොන්ගේ ප්‍රඥාව (3) ධර්මදේශකයා (4) සිරාක් හෙවත් උපදේශකයා

26. නව මැවිල්ලේ ආරම්භකයා ලෙස කැදවීම ලැබීමට හේතු වූ ප්‍රධාන කරුණු කිහිපයක් පහත දැක්වේ
- ඔහු සත් ගුණවත් මිනිසෙකි
- ඔහු පරම්පරාවෙන් නිදොස් මිනිසෙක් විය
- ඔහුගේ ධර්මිෂ්ඨකම ඔහුගේ පවුලේ සැම දෙනා ගැළවීමට හේතු විය.

මෙම කරුණු වලින් කියවෙන පුද්ගලයා වන්නේ
(1) නාතාන් දිවැසිවරයා ය (2) ශුද්ධ වූ පාවුලු තුමා ය (3) ශුද්ධ වූ ලූක් තුමා ය (4) නෝවා ය

27. ආදම් ට දෙවියන් වහන්සේගෙන් ලැබුණු දඬුවම් නම්
A - "පොළොවෙන් නුඹ නෙරපා දමනු අත." B- "දූවිල්ලෙන් වූ නුඹ දූවිල්ලටම යන්නෙහි ය."
C- "නුඹට වනයේ පලා කන්නට සිදු වන්නේය" D– "මින් මතු ඔබ පොළෝ තලය මත සාප ලද්දෙක් වේවා"
මින් වඩාත් නිවැරදි පිළතුර වන්නේ
(1) A , B හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B , C හා D ය.

28. උත්පත්ති පොතේ තුන්වන පරිච්ඡේදයේ දැක්වෙන සර්පයාගෙන් සංකේතවත් කරන්නේ
(1) මිනිසා තුළ ඇති රුචියයි (2) මිනිසා තුළ ඇති වහල්භාවයයි
(3) මිනිසා තුළ ඇති මුරණ්ඩුකමයි (4) මිනිසා තුළ ඇති නපුරුකමයි

29. පහත සඳහන් තොරතුරු කෙරෙහි අවධානය යොමු කරන්න
A - ජේසුස් වහන්සේව උත්තම පූජකයාගේ මැදුර වෙත ගෙන යාම
B - ජේසුස් වහන්සේව නාදුනන බව පේදුරු තුමා ප්‍රකාශ කිරීම
C -ජේසුස් වහන්සේව යුදා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගෙන යාම
D - ජේසුස් වහන්සේව හෙරෝද් ඇන්ටිපස් වෙත යැවීම
ඉහත සඳහන් අවස්ථා සිදුවූයේ
(1) ජේසුස් වහන්සේගේ උකුත් වීමේ දී ය (2) ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තියේ දී ය
(3) ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය අවස්ථාවේ දී ය (4) ජේසුස් වහන්සේගේ උත්ථානයේදී ය

30.පහත ප්‍රකාශ වලින් ජේසුස් වහන්සේ යුදා ශ්‍රේෂ්ඨාධිකරණ ප්‍රධානියාට පැවසූ වදන දැක්වෙන පිළිතුර වන්නේ
A - "මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයාණන් දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ හිදිනු ඇත"
B - " පියාණනී , මොවුන්ට කමා වුව මැනව. "
C- "ජේසුස් වහන්ස, ඔබ රාජශ්‍රීයෙන් වඩිනා කල මා සිහි කළ මැනව. "
D - "පියාණෙනී, ඔබගේ හස්තයට මාගේ ආත්මය භාර දෙමි"
(1) A ය (2) B ය. (3) C ය. (4 ) D ය

**31.** ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මුදවාගෙන පොරොන්දු දේශයට ගෙන යාමට කැඳවීම ලැබුනේ
**(1)** ජාකොබ් තුමාට ය **(2)** ආබ්‍රහම් තුමාට ය **(3)** මෝසෙස් තුමාට ය **(4)** ඊසාක් තුමාට ය

**32.** උත්පත්ති **12:7** ට අනුව **"**මේ දේශය නුඹේ පෙළපතට දෙන්නෙමි**"** යනුවෙන් දෙවියන් වහන්සේ පොරොන්දු වූයේ
**(1)** ශුද්ධ වූ පාවුලු තුමාට ය **(2)** මෝසෙස් තුමාට ය **(3)** දාවිත් රජතුමාට ය **(4)** ආබ්‍රහම් තුමාට ය

**33.** ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට මිසරයේ රජතුමා ගත් පියවර වන්නේ
A - බර වැඩ ගැනීම B - ධීවර කර්මාන්තයේ යෙදීම
C - උපදින විටම පිරිමි දරුවන් මරා දැමීම **D** - කෙත්වල විවිධ කෘෂි කර්මාන්ත වල යෙදීම
ඉහත පිළිතුරු වලින් නිවැරදි පිළිතුර වන්නේ
**(1)** A , C හා D ය. **(2)** A , B හා C ය. **(3)** B , C හා D ය. **(4)** B හා C ය.

**34.** අපෝස්තුලුවරුන් පත් කළ උපස්ථායකයෙකු වූයේ
**(1)** ශුද්ධ වූ මහා ජාකොබ් තුමා **(2)** සන්තියාගෝ මුනිතුමා
**(3)** ශුද්ධ වූ ස්තේපන් තුමා **(4)** ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා.

**35.** " පෙන්තකොස්ත" යන වචනයේ අර්ථය වන්නේ
**(1)** හතළිහ **(2)** පණහ. **(3)** හැත්තෑව. **(4)** දහය

**36.**දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමග ඇති කර ගන්නා ලද ගිවිසුමේ බාහිර බාහිර සලකුණ වන්නේ
**(1)** දේදුන්න **(2)** වලාකුළ **(3)** ගිනි වැඹ **(4)** චර්මඡේදනය

**37.**සාමාන්‍ය එඬේරික ජීවිතයක් ගත කළ ඉශ්‍රායෙල් ජනතාව සුවිශේෂී දේව ජනතාවක් බවට පත් වන්නේ
**(1)** ආබ්‍රහම් තුමා සමග ඇතිකර ගත් ගිවිසුම මගිනි **(2)** ආදිමව්පියන් සමග ඇති කර ගත් ගිවිසුම මගිනි
**(3)** නෝවා සමග ඇතිකර ගත් ගිවිසුම මගිනි **(4)** සීනයි ගිවිසුම මගිනි

**38.** ශුද්ධ වූ පාවුලු තුමා අධ්‍යාපනය ලබා ගත් ගුරුතුමා වනුයේ
**(1)** සාමුවෙල් ය **(2)** ගමාලියෙල් ය **(3)** තියෝපිලස් ය **(4)** කයිපාස් ය

**39.** රෝමයේ නීරෝ අධිරාජයාගේ පීඩන සමයේ දී **(**ක්‍රි.ව.**68)** හිස ගසා මරා දමනු ලැබුවේ
**(1)** ශුද්ධ වූ පේදුරු තුමා ය **(2)** ශුද්ධ වූ සෙබස්තියන් මුනිතුමා ය
**(3)** ශුද්ධ වූ පාවුලු තුමා ය **(4)** ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා ය

**40.** ක්‍රි.ව. **47** දී ශුද්ධ වූ පාවුලු තුමා සමග පළමු ධර්මදූත චාරිකාවට සහභාගී වූයේ

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර පරීක්ෂණය - 2019

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: 2 | පැය / மணித்தியாலம் / Hours: 02 |

- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශනයට ලකුණු 20 ක් ද , තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

**(1)**

1/ එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ දෙකක් ලියන්න

2/ ශුද්ධාත්ම ආගමන දිනයේදී අපෝස්තුලුවරුන් තුළ සිදු වූ විශේෂතා දෙකක් ලියන්න

3/ ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට දර්ශනය වූ අවස්ථා දෙකක් ලියන්න

4/ පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න

5/ ඉශ්‍රායෙල් දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න

6/ මිසර වැසියන්ට මුහුණ දීමට සිදු වූ පළමු හා අවසාන වසංගත නම් කරන්න

7/ ශුද්ධ බයිබලයේ ඇති ගිවිසුම් වල දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න

8/ දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇතිකර ගන්නනා ලද ගිවිසුමේ ප්‍රධාන කරුණු දෙක ලියන්න

9/ මතෙව් ශුභාරංචියට කියන වෙනත් නම් දෙකක් ලියන්න

10/ ද්විතීය පාවුලු සංදේශ දෙකක් නම් කරන්න

(ලකුණු 2×10=20)

**(2)** 1/ ශුද්ධ වූ ලූක් තුමා විසින් ලියූ ග්‍රන්ථ දෙක නම් කරන්න

2/ ශුද්ධ වූ ලූක් තුමාගේ ශුභාරංචියට භාවිතා වන වෙනත් නම් දෙකක් ලියන්න

3/ ශුද්ධ වූ ලූක් ශුභාරංචියෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 5ක් ලියා විස්තර කරන්න

(ලකුණු 2+3+5= 10)

**(3)** 1/ මැවීම පිළිබඳ පළමු කතාවට හා දෙවන කතාවට අයත් සම්ප්‍රදායන් දෙක නම් කරන්න

2/ සියලු මැවිලි වලට වඩා මිනිසාගේ උතුම්කම විදහා පාන ලක්ෂණ තුන ලියන්න

3/ දෙවන මැවීමේ කතාවට අනුව ස්ත්‍රිය මවනුයේ පුරුෂයාගේ ඉල ඇටයෙනි. මෙම කොටසින් කියවෙන අදහස් පහක් ලියා එයින් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ ලියන්න

(ලකුණු 2+3+5= 10)

**(4)** 1/ දේශක දිවැසිවරු දෙදෙනෙකු නම් කරන්න

2/ දේව කැඳවීමට විවෘත නොවූ ජෙරමියා දිවැසි වරයා ව දිරිමත් කිරීමට දෙවියන් වහන්සේ වදාළ වගන්ති තුනක් ලියන්න

3/ ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ කිතුනු ඔබට දිවැසි කාර්යයක් පැවරේ.එය වර්තමාන සමාජය තුළ ඔබ ක්‍රියාවට නංවන ආකාරය කරුණු පහකින් දක්වන්න

(ලකුණු 2+3+5= 10)

**(5)** 1/ දෙවියන් වහන්සේ ආදිමව්පියන් සමග ඇතිකර ගත් ගිවිසුම උත්පත්ති 3:15 වගන්තිය ට අනුව ලියා දක්වන්න

2/ නික්මයාම 20:1-11 වගන්තියට අනුව දෙවියන් වහන්සේ වෙත අපගේ යුතුකම් තුන ලියා දක්වන්න

3/ දසපනත අනුව අසල්වැසියා කෙරෙහි අපගේ යුතුකම් ඔබ ක්‍රියාත්මක කරන ආකාරය කරුණු පහකින් විස්තර කරන්න

(ලකුණු 2+3+5= 10)

**(6)** 1/ හෙබ්‍රෙව් බයිබලය භාවිතා කරන අය කවුරුන්ද?

2/ සෙප්ටුවාජින්ත පිටපත ගැන කරුණු තුනක් ලියා දක්වන්න

3/ ඔබේ ජීවිතය ආලෝකමත් කර ගැනීම සඳහා ද්විතීය සම්මත ග්‍රන්ථ උදව් කර ගන්නා ආකාරය කරුණු පහකින් විස්තර කරන්න

(ලකුණු 2+3+5= 10)

**(7)** පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න( පේළි 12ක් පමණ )

1/ යුගාන්තවාදය

2/ ශුද්ධ වූ පාවුලු තුමා

3/ යෙසායා දිවැසිවරයාගේ කැඳවීම

4/ ප්‍රාග් ඉතිහාසය

(ලකුණු 5+5= 10)